අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12.
நீதிச் சேவைகள் ஆணைக்குழுச் செயலகம், கொழும்பு 12.
Judicial Service Commission Secretariat, Colombo 12.

2023

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ஆண்டு செயல்திறன் அறிக்கை

Annual Performance Report



වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2023

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය

පටුන

පිටු අංක

කෙටියෙදුම්.....03

01 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය හා ව්‍යුහය.....04-10

02 - ආයතනයේ ප්‍රගතිය හා ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග 11-19

03 - 2023 වර්ෂය සඳහා මූල්‍ය සමාලෝචනය.....20-36

04 - කාර්ය සාධන දර්ශක.....37-40

05 - තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය.....41-42

06 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පිළිබඳ සාරාංශය.....43-45

07 - අනුකූලතා වාර්තාව.....46-57

භාවිතා කළ කෙටි යෙදුම්

01. ස.ලේකම්	- සහකාර ලේකම්
02. අ.හ.වි. නිලධාරි	- අභ්‍යන්තර විගණන නිලධාරි
03. ස.වි. නිලධාරි	- සහකාර විමර්ෂණ නිලධාරි
04. පරිපාලන නි.	- පරිපාලන නිලධාරි
05. වැඩසටහන් ස.නි	- වැඩසටහන් සහකාර නිලධාරි
06. භාෂා පරිව.	- භාෂා පරිවර්තක
07. තො.ස.තා නිලධාරි	- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි
08. ය.ලේ	- යතුරු ලේඛක
09. ලඝු.ලේ	- ලඝු ලේඛක
10. භාෂණ පරිව.	- භාෂණ පරිවර්තක
11. රා.ක.ස	- රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරි
12. පො.බැ	- පොත් බැඳුම්කරු
13. කා.කා.ස. -	කාර්යාල කාර්ය සහයක

අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය හා ව්‍යුහය

අපගැන

1.1 අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඈ ව්‍යවස්ථාව මගින් අධිකරණ සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත. අධිකරණයේ ස්වාධීනත්වය සුරැකීම, ස්වාධීන කොමිෂන් සභාවක් වශයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව පිහිටුවීමේ පරමාර්ථය වේ. ගරු අග්‍රවිනිශ්චයකාරතුමා නිල බලයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ඇ වගන්තියට අනුව අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරුන් දෙදෙනෙක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයින් ලෙස පත් කරනු ලබයි. අධිකරණ සේවා කොමිෂන් සභාවට ලේකම්වරයකු කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන අතර, ඔහු හෝ ඇය මුල් අවස්ථා අධිකරණ විනිශ්චයකාරවරුන් අතරින් පත්කරනු ලබන්නේ ය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති වශයෙන් ගරු අග්‍රවිනිශ්චයකාර ජයන්ත ජයසූරිය මැතිතුමා 2019 වර්ෂයේ අප්‍රේල් මස 29 වන දින පත්වූ අතර, 2023 වර්ෂය ආරම්භයේදී කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයින් වශයෙන් ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු බී.පී. අළුවිහාරේ මැතිතුමා සහ ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය මැතිතුමා ක්‍රියා කරන ලදී. ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය මැතිතුමා විශ්‍රාම යාමෙන් පසු එම පුරප්පාඩු සාමාජික තනතුර සඳහා ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ඊ.ඒ.ජී.ආර්. අමරසේකර මැතිතුමා 2023.02.09 දින පත් වන ලදී. ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු බී.පී. අළුවිහාරේ මැතිතුමා 2023.11.20 වන දින විශ්‍රාම යාමෙන් පසු එම පුරප්පාඩු සාමාජික තනතුර සඳහා ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ඩී.පී.එස්. ජයවර්ධන මැතිතුමා 2023.12.12 දින පත් වන ලදී. ඒ අනුව 2023 වර්ෂය අවසානයේදී ගරු අග්‍රවිනිශ්චයකාර ජයන්ත ජයසූරිය මැතිතුමාට අතිරේකව සෙසු සාමාජිකයින් වශයෙන් ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ඊ.ඒ.ජී.ආර්. අමරසේකර මැතිතුමා සහ ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ඩී.පී.එස්. ජයවර්ධන මැතිතුමා ක්‍රියා කරන ලදී.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වශයෙන් මහාධිකරණ විනිසුරු එච්.එස්.සෝමරත්න මහතා කටයුතු කරන අතර, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් වශයෙන් දිසා විනිසුරු පී.එම්.ටී.බණ්ඩාර මහතා (ශ්‍රී ලංකා අධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණිය), දිසා විනිසුරු ඩී.එම්.ඩී.සී.බණ්ඩාර මහතා (ශ්‍රී ලංකා අධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණිය) සහ ගරු අගවිනිසුරුතුමාගේ ලේකම්, දිසා විනිසුරු ආනන්දි කනගරත්නම් මෙනෙවියද (ශ්‍රී ලංකා අධිකරණ සේවයේ I පන්තිය I ශ්‍රේණිය) ක්‍රියා කරන ලදී.ඊට අතිරේකව 2022.04.04 දින සිට අතිරේක මහේස්ත්‍රාත් සී.එච්.ජී.ලියනගේ මහතා (ශ්‍රී ලංකා අධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණිය) අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලන කටයුතු වලට සහය වීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවට අනියුක්ත කර ඇත.

2023 වර්ෂයේදී අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සංයුතිය විධායක නිලධාරීන්, මාණ්ඩලික නිලධාරීන්, කළමනාකරණ සහකාර නිලධාරීන් සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩලයෙන් සමන්විත විය.

යුක්තිය පසිදලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහාත්, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව එය ඉෂ්ඨ සිද්ධ කිරීම සඳහාත්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලනයට යටත්ව දිවයින පුරා පිහිටුවා ඇති අධිකරණ පහත පරිදි දැක්විය හැක.

I.	ස්ථීර ත්‍රිපුද්ගල මහාධිකරණ	- 02
II.	වාණිජ මහාධිකරණ	- 01 (ශාලා 04කින් සමන්විත)
III.	පළාත්බද මහාධිකරණ	- 34
IV.	සිවිල් අභියාචනා මහාධිකරණ	- 22
V.	දිසා අධිකරණ	- 33
VI.	දිසා/මහේස්ත්‍රාත් අධිකරණ	- 52
VII.	මහේස්ත්‍රාත් අධිකරණ	- 54
VIII.	ළමා මහේස්ත්‍රාත් අධිකරණ	- 02
IX.	කම්කරු විනිශ්චය සභා	- 39

2023 වර්ෂය අවසාන වන විට මහාධිකරණ විනිශ්චයකාරවරුන් 88 දෙනෙක්,දිසා විනිසුරු/මහේස්ත්‍රාත්වරුන් 259 දෙනෙක්, කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් 30දෙනෙක් හා උපලේඛනගත රජයේ නිලධාරීන්/සංවර්ධන නිලධාරීන් 5117 දෙනෙක් අධිකරණ සේවා කොමිෂන් සභාව යටතේ පවතින දිවයින පුරා පිහිටි පෙර සඳහන් අධිකරණවල යුක්තිය පසිදලීමේ ක්‍රියාවලියේ නිරත වන ලදී.

අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරමින් විධායකය හා ව්‍යවස්ථාදායකය අතර සංවරණ හා තුලනයක් පවත්වා ගනිමින් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමටත් ඒ සඳහා අවශ්‍ය වන යුක්තිය පසිදලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කොට වේගවත් කිරීමටත් අධිකරණ සේවා කොමිෂන් සභාව පියවර ගෙන තිබේ.

1.2 අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ මූලික කාර්යයන්

- මහාධිකරණ විනිසුරුවරුන්ගේ පත් කිරීම් හා විනය කටයුතු පිළිබඳව ජනාධිපතිතුමාට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- මහාධිකරණ විනිසුරුවරුන්ගේ පුහුණු කිරීම හා ස්ථාන මාරු කිරීම.
- මුල් අවස්ථා අධිකරණ විනිශ්චයකාරවරුන් වන දිසා විනිශ්චයකාරවරුන්, මහේස්ත්‍රාත්වරුන්, කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් හා විනය පාලනය.
- අධිකරණ වල කාර්යමණ්ඩලය ලෙස සේවය කරන උපලේඛනගත සේවයට අයත් රජයේ උපලේඛනගත නිලධාරීන් පත් කිරීම, ස්ථාන මාරු සිදුකිරීම, උසස් වීම් සහ ඔවුන්ගේ විනය සම්බන්ධ කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදු කිරීම.
- ව්‍යවස්ථාව මගින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ලබා දී ඇති බලතලවලට යටත් වන අධිකරණවල පරිපාලනය හා අධීක්ෂණය.
- 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත ප්‍රකාරව සිය රැකියාව අතරතුරදී හදිසි අනතුරුවලට මුහුණපාන කම්කරුවන්ගේ (සේවකයන්ගේ) වන්දි ඉල්ලීම් පිළිබඳව කටයුතු කරන කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය සඳහා කොමසාරිස් සහ/හෝ නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් පත් කිරීම.
- මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත ප්‍රකාරව මුස්ලිම් ප්‍රජාවගේ පවුල් අධිකරණ බලය හොබවන ක්වාසිවරුන් පත්කිරීම, පුහුණු කිරීම හා විනය පාලනය.
- 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරි පනත ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා පොලිස් කොමිෂන් සභාවේ තීරණයන් පිළිබඳ අභියාචනා අධිකාරිය වන පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ සභාපතිවරයා හා සාමාජිකයින් පත්කිරීම.
- 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත හා 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත ප්‍රකාරව ගොවිජන සේවා සමාලෝචන මණ්ඩල පිහිටුවීම සඳහා පුද්ගලයින් 09 කට නොඅඩු ගණනකින් සමන්විත මණ්ඩලයක් පත් කිරීම. ගොවිජන සේවා සමාලෝචන මණ්ඩලය ගොවිජන විනිශ්චය සභාවේ තීරණයන් පිළිබඳ මුල් අභියාචනා අධිකාරියවේ.
- දිසා අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ සම්බන්ධවත්, සමස්ත අධිකරණ කාර්ය මණ්ඩලය සම්බන්ධවත් තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉදිරිපත් කර ඇති ඉල්ලීම් සම්බන්ධව 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතේ විධි විධාන ප්‍රකාරව තොරතුරු නිලධරයා සහ නම් කළ නිලධරයා ලෙස කටයුතු කිරීම.

- 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත ප්‍රකාරව අභියාචනා විභාග කරනු ලබන ඉඩම් අත්පත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය සඳහා සභාපති ඇතුළුව සමාජිකයින් 16 දෙනෙකු පත් කිරීම සඳහා නිර්දේශ ලබා දීම.

- 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ පනත හා 2011 අංක 05 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත ප්‍රකාරව දරුවන් විසින් රැකබලා නොගන්නා දෙමව්පියන්ගේ නඩත්තු අයදුම්පත් තීරණය කරන වැඩිහිටි නඩත්තු මණ්ඩලයේ සභාපති සහ අනෙකුත් සාමාජිකයින් පත් කිරීම.

1.3 අධිකරණ සේවා කොමිෂන් සභාවේ ආයතනික ව්‍යුහය සහ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ ආයතනික ව්‍යුහය

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ආයතනික ව්‍යුහය

අග්‍රවිනිශ්චයකාරතුමා
(සභාපති)


↓

ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිසුරුවරුන් දෙදෙනා
(අධිකරණ සේවා කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයින්)


↓

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ ආයතනික ව්‍යුහය



අධිකරණ පද්ධතියේ ආයතනික ව්‍යූහය



ආයතනයේ ප්‍රගතිය හා ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග

2.1 2023 වර්ෂයේදී යුක්තිය පසිඳලීමේ කාර්යය පහසු කිරීම, කාර්යක්ෂම කිරීම, වේගවත් කිරීම සහ ශක්තිමත් කිරීමෙහි ලා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග හා එහි ප්‍රගතිය

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අධීක්ෂණයට යටත් අධිකරණ හා යුක්තිය පසිඳලීමේ ආයතනද ඒ හා සම්බන්ධ අනෙකුත් ආයතනද සමග මනා සම්බන්ධතාවයක් ගොඩ නඟා ගනිමින්, අධිකරණ සේවා කොමිෂන් සභාව යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට හා වේගවත් කිරීමට අවශ්‍ය කටයුතු හා ක්‍රියාමාර්ග ගෙන ඇත.

2023 වර්ෂයේ ජනවාරි 01 දින සිට දෙසැම්බර් මස 31 දක්වා කාල සීමාව තුලදී කොමිෂන් සභා රැස්වීම් 41 කට අධික සංඛ්‍යාවක් පවත්වමින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ විෂය පථය තුලට ගැනෙන අධිකරණවල (අධිකරණ නිලධාරීන්/විනිසුරුවරුන් සහ කාර්ය මණ්ඩලය) පරිපාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තීන්දු තීරණ ගෙන ඇත.

- නව බඳවා ගැනීම් සම්බන්ධයෙන් පනවා තිබූ සීමා කිරීම් නිසා අධිකරණ නිලධාරීන්ගේ හා අධිකරණ කාර්ය මණ්ඩලවල පැවති පුරප්පාඩු පිරවීමට අධිකරණ සේවා කොමිෂන් සභාවට නොහැකි විය. තවද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 14/2022 (I) සහ 14/2022 (II) මත පදනම්ව වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම හා වෛකල්පිත පදනම මත විශ්‍රාම ගැනීම ආදිය නිසා ඇති වූ පුරප්පාඩු මත කාර්ය මණ්ඩල අඩුවීමෙන් ඇති වූ බලපෑම වඩාත් තීව්‍ර විය.

  ඒ අනුව ඉතා අඩු මානව සම්පතක් මගින් දිවයින පුරා අධිකරණවල අධිකරණ කටයුතු පවත්වාගෙන යාම 2023 වර්ෂය තුල අභියෝගාත්මක කාර්යක් විය. එවැනි සන්දර්භයකදී දිවයිනේ සියලු අධිකරණවල අධිකරණ කටයුතු බාධාවකින් තොරව පැවැත්වෙන බවට වග බලා ගැනීම පිණිස මානව සම්පත (විනිශ්චයකාරවරුන් හා කාර්ය මණ්ඩල) සුපරීක්ෂාකාරීව කළමනාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලදී.

- කෙසේ වුවත් පසු අවස්ථාවකදී අධිකරණ පද්ධතියේ ඇති වූ අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය සාධාරණීකරනයන් ඉදිරිපත් කර උපලේඛනගත රජයේ නිලධාරීන් 210 දෙනෙකු සහ අධිකරණ නිලධාරීන් 30 දෙනෙකු බඳවා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය අදාළ අංශවලින් ලබා ගැනීමට ක්‍රියා කරන ලදී.

- ප්‍රතිපාදන ලැබූ වහාම 2023.12.01 දින අධිකරණ නිලධාරීන් 30 දෙනෙකු බඳවා ගැනීමට හා 2023 වර්ෂය අවසන් වීමට පෙර උපලේඛනගත රජයේ නිලධාරීන් 210 දෙනෙකු බඳවා ගැනීමට

ක්‍රියා කල අතර, එම උපලේඛනගත රජයේ නිලධාරීන් 210 දෙනා බඳවා ගන්නා ලද ආකාරය පහත දැක්වේ-

බඳවාගත් ඛාණ්ඩය	බඳවාගත් ප්‍රමාණය
අධිකරණ රෙජිස්ට්‍රාර්	20
අධිකරණ භාෂණ පරිවර්තක	40
අධිකරණ ලිපිකරු	75
අධිකරණ ලඝුලේඛක	75

මෙම වර්ෂය තුලදීත් අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් ප්‍රමාදයකින් තොරව අධිකරණවල පරිපාලනය විධිමත්ව පවත්වා ගැනීම සඳහා නිරන්තරයෙන් කොමිෂන් සභා රැස්වීම් පවත්වමින් අවශ්‍ය පරිපාලන තීන්දු තීරණ ගැනීම සිදු කරන ලදී.

- 2023 වර්ෂයේදී අධිකරණ කටයුතු අධීක්ෂණය කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් යොදා ගන්නා සාමාන්‍ය ක්‍රියාපටිපාටියට අතිරේකව සුදුසු පසුවිපරම් යාන්ත්‍රණයක් මගින් කඩිනම් ප්‍රතිකර්ම සැපයීමේ අපේක්ෂාවෙන් අධිකරණවල බිම් මට්ටමේ පවතින ගැටලු/ඌනතා හඳුනා ගැනීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවේ ගරු සාමාජික විනිසුරුතුමෙකු හා අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ සහභාගිත්වයෙන් ‘‘හදිසි අධිකරණ පරීක්ෂණ’’ (**Sudden Court Inspections)** පැවැත්වීමට කටයුතු කර ඇත.

- USAID ආයතනයේ සහාය ඇතිව ක්‍රියාත්මක කරන ලද නඩු කළමනාකරණ නියමු ව්‍යාපෘතිය (Case Management and Court Management Pilot Project) තවදුරටත් ව්‍යාප්ත කිරීමට පියවර ගෙන ඇත.


  ඒ අනුව, අලුතින් අධිකරණ 06 ක් ඉහත දක්වා ඇති නියමු ව්‍යාපෘතියට ඇතුලත් කිරීමට පියවර ගෙන ඇත.(කොළඹ මහාධිකරණ අංක 02 සහ 06, කැස්බෑව දිසා/මහේස්ත්‍රාත් අධිකරණය, පානදුර දිසා අධිකරණය සහ පානදුර මහේස්ත්‍රාත් අධිකරණය)

- ඉහත ව්‍යාපෘතියට සම්බන්ධ කාර්යමණ්ඩල නිලධාරීන් හා අනෙකුත් කාර්ය මණ්ඩලවල කුසලතා (පරිගණක, කළමනාකරණ හා පාරිභෝගික සේවාවන්ට අදාලව) වර්ධනය කිරීම සඳහා USAID ආයතනය සමග එක්ව අඛණ්ඩව පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

- අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සම්පත් දායකත්වය යටතේ 2023 වර්ෂය සඳහා සිවිල් නීතිය, අපරාධ නීතිය, කාර්යාල කළමනාකරණය හා විනය කාර්යය පටිපාටිය පිළිබඳව අඛණ්ඩ පුහුණු වැඩසටහන් 05ක් පවත්වා උපලේඛනගත රජයේ නිලධාරීන් 150 දෙනෙකු සඳහා පුහුණුව ලබා දී ඇති අතර, එම විෂයන්වලට අදාලව කලාප පුහුණු වැඩසටහන් 07ක් මගින් මහාධිකරණ කලාප 07ක උපලේඛනගත රජයේ නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් 1276 දෙනෙකුට අධික නිලධාරීන් පිරිසක් සඳහා පුහුණුව ලබා දී ඇත.

- 2023 වර්ෂය තුළ දිවයින පුරා පිහිටි දිසා අධිකරණ, මහේස්ත්‍රාත් අධිකරණ හා දිසා/මහේස්ත්‍රාත් අධිකරණවල පැවති නඩු අතරින් සිවිල් නඩු 60036 හා අපරාධ නඩු 725464 ප්‍රමාණයක් විසඳා ඇති අතර, 2022 වර්ෂයේ හා 2023 වර්ෂය තුල පැවති සිවිල් හා අපරාධ නඩු ප්‍රමාණ පිලිබඳ සංඛ්‍යාත්මක තොරතුරු ඇතුලත් ප්‍රස්ථාරයක් පහත දැක්වේ.

2022 හා 2023 වර්ෂයන්ට අදාලව
නඩු කටයුතු සම්බන්ධ තොරතුරු



	සිවිල් නඩු සංඛ්‍යාව	අපරාධ නඩු සංඛ්‍යාව	මුළු නඩු සංඛ්‍යාව
2022 වර්ෂය	237,685	565,611	803,296
2023 වර්ෂය	239,795	579,227	819,022

- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා පොලිස් කොමිෂන් සභාවේ තීරණයන් පිළිබඳ අභියාචනා අධිකාරිය වන පරිපාලන විනිශ්චය අධිකාරියේ සාමාජිකයෙකු පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම.

- 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත හා 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත ප්‍රකාරව ගොවිජන සේවා සමාලෝචන මණ්ඩල පිහිටුවීම සඳහා පුද්ගලයින් 09කට නොඅඩු ගණනකින් සමන්විත මණ්ඩලයක් 2023 වර්ෂයේදී පත් කිරීම.

- පවත්නා නඩු කටයුතු සම්බන්ධව, නඩු ප්‍රමාදවීම් සම්බන්ධව හා අධිකරණ නිලධාරීන් හා කාර්යමණ්ඩල සාමාජිකයන් සම්බන්ධව මහජනතාව විසින් හා වෙනත් රජයේ ආයතන හරහා අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පෙත්සම් හා ඉල්ලීම් පිලිබඳ අවශ්‍ය විමර්ෂණ කඩිනමින් සිදු කර ඒ සඳහා විසඳුම් ලබා දීමට අවශ්‍ය කරන තීන්දු තීරණ ලබා දීමට අධිකරණ සේවා කොමිෂන් සභාව ක්‍රියාමාර්ග ගෙන ඇත. එවැනි පෙත්සම් 1000කට වඩා වැඩි ප්‍රමාණයකට අදාල තීන්දු තීරණ 2023 වර්ෂයේදී අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇත.

- තොරතුරු දැන ගැනීමේ පනත යටතේ යොමු වී ඇති ඉල්ලීම් 53 කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහාත් එපරිද්දෙන් ප්‍රතිචාර හා විසඳුම් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇත.

- විනිශ්චයකාරවරුන්ට හා උපලේඛනගත රජයේ නිලධරයන්ට එරෙහිව ලැබෙන පැමිණිලි පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ දැඩි අවධානය යොමු කරන අතර, ඒවා සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඌ දරන ව්‍යවස්ථාව ප්‍රකාරව විමර්ශන පැවැත්වීම සහ ඉන් හෙළිවන කරුණු අනුව විනය පරීක්ෂණ පැවැත්වීම ආදී විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ලබයි.

  ඒ අනුව 2023 වර්ෂය තුල මූලික විමර්ෂන කටයුතු 7ක් අවසන් කර ඇති අතර, විධිමත් විනය පරීක්ෂණ 05ක කටයුතු අවසන් කර ඇත.

  එසේම නව මූලික විමර්ෂණ ආරම්භ කිරීම සම්බන්ධයෙන් වූ නියෝග 15ක් ලබා ගෙනද ඇත.

- විනිශ්චයකාරවරුන් විසින් නඩු විභාග/විමසීම් කටයුතු ප්‍රමාදයකින් තොරව කාර්යක්ෂමව සිදු කිරීම සහතික කරනු වස්, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඔවුන් සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන සුවිශේෂී කාර්ය සාධන ඇගයීම් ක්‍රමවේදය අඛංඩව පවත්වාගෙන යාමට ක්‍රියා කර ඇත. එහි මූලික අංගය වන්නේ වැටුප් වර්ධක වර්ෂයක් තුල දිසා විනිශ්චයකාරවරුන් හා මහේස්ත්‍රාත්වරුන් විසින් ලියා අවසන් කල යුතු අවම හබ කරන ලද අවම නඩු තීන්දු/නියෝග සංඛ්‍යාවක් නියම කිරීමයි.

- වැටුප් වර්ධක වර්ෂයක් තුල විනිශ්චයකාරවරුන් විසින් නඩු විභාග/විමසීම් කටයුතු ප්‍රමාදයකින් තොරව කාර්යක්ෂමව සිදු කල යුතු බව සහතික කිරීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් විවිධ අවස්ථාවල චක්‍රලේඛ නිකුත් කිරීම මගින් ඔවුන් දැනුවත් කර ඇත.

- 2023 වර්ෂය තුලද විනිශ්චයකාරවරුන් සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන සුවිශේෂී කාර්ය සාධන ඇගයීම් ක්‍රමවේදය අඛංඩව පවත්වාගෙන යාමට ක්‍රියා කර ඇත.

- ඉහත ක්‍රමවේදයම අනුගමනය කරමින් කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා 2022 වර්ෂයේදී නිකුත් කරන ලද චක්‍රලේඛය, 2023 වර්ෂයේ සිට සම්පූර්ණ වශයෙන්ම ක්‍රියාත්මක කිරීමට ආරම්භ කරන ලදී.

- විවිධ පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ ආදිය සඳහා සුදුසු විනිසුරුවරුන් තේරීම හා නම් කිරීම මගින් ඔවුන්ගේ හැකියාවන් වර්ධනයට පහසුකම් සැලසීමට පියවර ගෙන ඇත.

- විනිශ්චයකාරවරුන්ගෙන් නිසි සේවයක් ලබා ගැනීම අරමුණු කරමින් ඔවුන් තෘප්තිමත් කිරීම පිණිස ඔවුන්හට විධිමත් උසස්වීම් කාර්ය පටිපාටියක් හඳුන්වා දී ඇති අතර, වාර්ෂික වැටුප් වර්ධක නිසි පරිදි ලබා දීම, ජ්‍යෙෂ්ඨත්වය අනුව සුදුසු සේවා ස්ථාන ලබා දීම, නිල නිවාස සහ නිල රථ ආදී පහසුකම් ලබා දීමට මැදිහත් වීම.

- අධිකරණ භූමි තුළ ගොඩගැසී ඇති නඩු භාණ්ඩ නව තාක්ෂණය භාවිතා කරමින් කඩිනමින් නිශ්කාෂණය කිරීමට අදාලව අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 422 නිකුත් කිරීම හා ඊට අදාල මාර්ගෝපදේශ හා උපදෙස් අනුව ක්‍රියාකරමින් නඩු භාණ්ඩ නිෂ්කාෂණ කටයුතු සිදු කරන්නේද යන්න පිළිබඳ පසුවිපරම් සිදුකිරීම.

  ඒ අනුව මහේස්ත්‍රාත් අධිකරණ මගින් නඩු භාණ්ඩ බැහැර කිරීම සඳහා අවම වශයෙන් වසරක් තුළ වෙන්දේසි 5ක් පැවැත්වීමට නියම කරමින් නඩු භාණ්ඩ බැහැර කිරීම කාර්යක්ෂම කිරීම.

- අධිකරණ කාර්ය මණ්ඩලයේ දැනුම යාවත්කාලීන කිරීමේ අරමුණින් එක් එක් සේවාවන්ට අදාල කාර්යක්ෂමතා කඩඉම් ආදී සියළු විභාග පැවැත්වීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
  ඒ අනුව, 2023 වර්ෂයේ දී පහත එක් එක් සේවාවන්ට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා ඇත;
  - **i)** අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ රෙජිස්ට්‍රාර් **III** ශ්‍රේණිය හා **II-I** ශ්‍රේණිය,
  - **ii)** අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ භාෂණ පරිවර්තක **II** ශ්‍රේණිය,
  - **iii)** අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලිපිකරු **III** ශ්‍රේණිය හා **II** ශ්‍රේණිය,
  - **iv)** අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලඝු ලේඛක **II** ශ්‍රේණිය (පැරණි) සහ **II** ශ්‍රේණිය (නව),
  - **v)** අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ යතුරු ලේඛක **III** ශ්‍රේණිය,
  - **vi)** අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ පොත් බැඳුම්කරු **III** ශ්‍රේණිය.

- 2023 වර්ෂයේදී අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් 83 දෙනෙකු II-I ශ්‍රේණියට උසස් කර ඇත. තවද අධිකරණ භාෂණ පරිවර්තක අධි ශ්‍රේණිය සඳහා 05 දෙනෙකුත්, අධිකරණ ලිපිකරු අධි ශ්‍රේණිය සඳහා 21 දෙනෙකුත්, I ශ්‍රේණිය සඳහා 126 දෙනෙකුත්, අධිකරණ ලඝු ලේඛක අධි ශ්‍රේණිය සඳහා 21 දෙනෙකුත්, අධිකරණ යතුරු ලේඛක අධි ශ්‍රේණිය සඳහා 04 දෙනෙකුත් හා අධිකරණ පොත් බැඳුම්කරු II ශ්‍රේණිය සඳහා නිලධාරින් 01 අයෙකුටත් වශයෙන් උසස්වීම් ලබා දී ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ ස්ථිර ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු තවමත් නිම වී නොමැති නිසා තව දුරටත් (2017 වර්ෂයේ සිට) අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය රාජකාරී කටයුතු සිදු කරනු ලබන්නේ පෙර නිමි ගොඩනැගිලි හා කන්ටේනර් පෙට්ටිවලින් නිර්මිත තාවකාලික පරිශ්‍රයක වේ. එම නිසා පරිපාලන කටයුතු මෙහෙයවනු ලබන්නේ බොහෝ දුෂ්කරතා සහ අපහසුතා මධ්‍යයේ වේ. තවද සමස්ථ උපලේඛනගත රාජ්‍ය නිලධාරීන්ගේ සේවයේ (අධිකරණ කාර්ය මණ්ඩලයේ) පුරප්පාඩු අධික ප්‍රමාණයක් පවතින අතර, නව බඳවා ගැනීම් සිදු කිරීමේ නොහැකියාව නිසා දිවයින පුරා පිහිටි සියලු අධිකරණවල අධිකරණ කටයුතු (අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයද ඇතුලුව) ගැටලුවකින් තොරව පවත්වා ගැනීමට ඉමහත් පරිශ්‍රමයක් ගනිමින් පවතී. අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ වැඩ කටයුතුද අනුමත සේවක සංඛ්‍යාවෙන් අඩක ප්‍රමාණයකින් ක්‍රියාත්මක වේ.

එවැනි බාධක, අභියෝග සහ ගැටලු මධ්‍යයේ වුවද අධිකරණ සේවා කොමිෂන් සභාව 2023 වරෂයේ සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇත.

2.2 ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග

- අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලනයට යටත් සියලු අධිකරණ හා ආයතන වල යුක්තිය පසිදලීමේ කර්තව්‍ය අධික්ෂණය කිරීම සඳහාත් ඒවායේ පරිපාලනය නිසි පරිදි පවත්වාගෙන යාම සඳහාත් **2022** වර්ෂයේ දී උපයෝගී කර ගත් මෙවලම් තවදුරටත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස යොදා ගැනීම.

- පෙර දැනුම් දීමකින් තොරව අධිකරණ පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය තවදුරටත් පුළුල්ව දියත් කිරීම.

- හැකිතාක් දුරට අධිකරණ සඳහා නඩු කළමනාකරණ පිලිවෙත් **(case managements practices)** හඳුන්වා දීම.

- ඉහත කරුණට අදාලව **USAID** ආයතනය හා එක්ව ආදර්ශ අධිකරණ ව්‍යාපෘතිය (Model Court Project) තවදුරටත් පුළුල් කරමින් එය ක්‍රියාත්මක වන අධිකරණ සංඛ්‍යාව වැඩි කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

- විසඳීම පමාවී, කල්ගත වී ඇති නඩු සහිත අධිකරණ හඳුනා ගැනීමට පියවර ගෙන එම අධිකරණ වල පවතින එවැනි නඩු විසඳීමට අවශ්‍ය විශේෂිත ක්‍රියා මාර්ග ගැනීම. (එවැනි කල්ගතවූ නඩු විසඳීම සඳහා අතිරේක විනිශ්චයකාරවරුන් පත් කිරීම)

- නිශ්කාශනය නොකරන ලද නඩු භාණ්ඩ ගොඩගැසුණු අධිකරණ හඳුනාගෙන එම නඩු භාණ්ඩ කඩිනමින් නිශ්කාශනය කිරීම සඳහා කෙටි කාල සීමාවකට වෙනම විනිශ්චයකාරවරයෙක් ‘‘අතිරික්ත/අතිරේක’’ පදනමින් වෙනම කාර්ය මණ්ඩලයක් සමග පත් කිරීම.

- අධිකරණ වල පවතින ඉතා පැරණි නඩු හඳුනාගෙන එම නඩු කඩිනමින් විසඳීම සඳහා ප්‍රමුඛත්වය ලබාදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

- අධිකරණවල කටයුතු බාධාවකින් තොරව ඉෂ්ඨ සිද්ධ වන බව සනාථ කරනු වස් අධිකරණ නිලධාරින්ගේ පවතින පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

- උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ (අධිකරණ කාර්ය මණ්ඩලය) සේවක පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය අරමුදල් භාණ්ඩාගාරයෙන් ලබා ගැනීම.

- දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විනිසුරුවන් පුහුණු කිරීම සඳහා පහසුකම් සැලසීම.

- අධිකරණයන්හි සේවය කරන උපලේඛනගත සේවයට අයත් රජයේ නිලධරයන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම සඳහා දැනට පවත්වාගෙන යනු ලබන පුහුණු වැඩ සටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම සහ අමතර පුහුණු වැඩසටහන් සකසා ආරම්භ කිරීම.


- අලුතින් ස්ථාපිත කිරීමට සැලසුම් කර එසේ ස්ථාපිත කරනු ලබන අධිකරණ වල යටිතල පහසුකම් සැපයූ වහාම ඒ සඳහා අවශ්‍ය විනිසුරුවරුන් සහ කාර්ය මණ්ඩලය පත්කර නඩු කටයුතු ආරම්භ කිරීම.

- අධිකරණ ඩිජිටල්කරණ ක්‍රියාවලියට පහසුකම් සැලසීම.

- අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සතු සම්පත් ප්‍රවර්ධනය කිරීම.

තුන්වන කොටස

2023 වර්ෂය සඳහා මූල්‍ය සමාලෝචන වාර්තාව



ඒසිජ්-එස්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු.		සටහන	තක්ත 2023 රු.	2,022 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිජ්-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		77,339,000	81,055,000	ඒසිජ්-3
-	නැන්පතු		712,117	151,510	ඒසිජ්-4
-	අත්තිකාරම් ගිණුම්		2,595,115	2,682,235	ඒසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		80,646,232	83,888,745	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		80,646,232	83,888,745	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		4,398	219,868	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඈ = (ඇ)-(ඇ)		80,641,834	83,668,877	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
72,580,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	63,556,511	64,040,398	
32,320,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	21,487,324	22,370,479	ඒසිජ්-2(ii)
300,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	280,886	270,461	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
105,200,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		85,324,721	86,681,338	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	76,810	348,630	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිජ්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
300,000	හැකියා වර්ධනය	14	40,000	-	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
800,000	මුළු මූලධන වියදම් (උ)		116,810	348,630	
	නැන්පතු ගෙවීම්		799,378	95,224	ඒසිජ්-4
	අත්තිකාරම් ගෙවීම්		3,261,347	2,856,541	ඒසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		4,060,725	2,951,765	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		89,502,256	89,981,733	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(8,860,422)	(6,312,856)	
	අග්‍රිම ඇලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(8,860,422)	(6,312,856)	ඒසිජ්-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිජ්-3
			(8,860,422)	(6,312,856)	

1

ඒසිඒ-5


2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	කළඹ 2023 රු.	2022 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියන හා උපකරණ	ඒසිඒ-5	433,640,040	433,594,509
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	8,916,373	8,250,141
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**442,556,413**	**441,844,650**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		8,908,534	8,155,041
දේපළ පිරියන හා උපකරණ සංචිතය		433,640,040	433,594,509
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	-	
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	7,839	95,100
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**442,556,413**	**441,844,650**

පිටු අංක 01 සිට 28 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 29 සිට 31 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොළ සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමිසාරිස් (මුදල්)
තනතුර : 29/02/2024	තනතුර : 29/02/2024	නම :
දිනය :	දිනය :	දිනය : 2024/02/29
එච්. සංජීව සෝමරත්න	එච්. සංජීව සෝමරත්න	ඩී.එන්.ආර්.ජයරත්න
ලේකම්	ලේකම් 2	ගණකාධිකාරි
අධිකරණ සේවා කොමිෂන් සභාව	අධිකරණ සේවා කොමිෂන් සභාව	අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12	කොළඹ 12	කොළඹ 12.



එස්ජේ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරනා ලද ආදායම්	8,272,122	6,793,640
අග්‍රිම ලැබීම්	77,339,000	81,055,000
අත්තිකාරම් අයකර ගැනීම්	3,045,415	2,121,051
තැන්පතු ලැබීම්	712,117	151,510
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	89,368,654	90,121,201
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	84,905,835	86,330,477
සහනාධාර සහ මාරුකිරීම්	280,886	270,461
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන් ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	4,398	219,868
අත්තිකාරම් ගෙවීම්	3,261,347	2,856,541
තැන්පතු ගෙවීම්	799,378	95,224
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	89,251,844	89,772,571
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	116,810	348,630
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	116,810	348,630
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	116,810	348,630
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(116,810)	(348,630)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදාන්‍යයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

භුවමාරු හා භුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම්" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම් යටතේ හෙළිදරව් කළ යුතු ය.

6

3.5 ආදායම් කාර්ය සාධනය

රු. ,000

ආදායම් සංකේතය	ආදායම් විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		ආදායම් රැස්කිරීම	
		මූලික ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	මුදල (රු.)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස
අදාල නොවේ.					

3.6 ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	ප්‍රතිපාදන		තථ්‍ය වියදම්	අවසාන වෙන් කිරීමේ ප්‍රතිශතයක් ලෙස ප්‍රතිපාදන භාවිතය
	මූලික	අවසන්		
පුනරාවර්ථන	**105,200**	**105,200**	**85,324.721**	**81.11%**
ප්‍රාග්ධන	**800**	**800**	**116.810**	**14.60%**

3.7 මු.රෙ.208 අනුව, මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාව අනෙකුත් අමාත්‍යාංශවල නියෝජිතයෙකු ලෙස/ දෙපාර්තමේන්තුවලට වියදම් සඳහා ප්‍රතිපාදන ප්‍රදානය කිරීම.

රු. ,000

අනුක්‍රමික අංකය	කුමන අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ප්‍රතිපාදන	වෙන් කිරීමේ අරමුණ	ප්‍රතිපාදන		තථ්‍ය වියදම්	අවසාන වෙන් කිරීමේ ප්‍රතිශතයක් ලෙස ප්‍රතිපාදන භාවිතය
			මූලික	අවසන්		
	නැත					

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	**2023.12.31** දිනට සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය	**2023.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාවට අනුව ශේෂය	තවදුරටත් ගිණුම් ගත කිරීමට ඇති ශේෂය	ප්‍රතිශතයක් ලෙස වාර්තා කිරීමේ ප්‍රගතිය
9151	ගොඩනැගිලි සහ ව්‍යුහයන්	**2,612.225**	**2,612.225**		
9152	යන්ත්‍රෝපකරණ සහ උපකරණ	**23,399.984**	**23,399.984**		
9153	ඉඩම්	**379,000.00**	**379,000.000**		
9154	අස්පෘශ්‍ය වත්කම්		-		
9155	ජීව වත්කම්		-		
9160	වැඩකිරීමේ ප්‍රගතිය		-		
9180	බදු වත්කම්		-		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

* විගණකාධිපතිවරයා විසින් යොමු කරන ලද 2024.05.30 දිනැති විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සඳහා 27 පිටුව වෙත යොමු වන්න.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. JLO/B/JSC/FA/2023/09 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2024 මැයි 30 දින

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

ශීර්ෂය 007 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 007 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306 72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහිවන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

(අ) 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 3.1 ඡේදය ප්‍රකාරව CIGAS වෙබ් යෙදුම් පද්ධතියෙන් ලබාගත් අවසාන භාණ්ඩාගාර මුද්‍රිත මූල්‍ය ප්‍රකාශනයට අමුණා නිබිය යුතු වුවත්, SA 12, SA 20, SA 40, SA 90 මුද්‍රිත ඉදිරිපත් කර නොනිබුණි.

(ආ) අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ ඡේද 6 හි ඒසිඒ 5 ආකෘතිය අනුව පිළියෙල කරනු ලබන, 2023 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය (ඒසිඒ -5) ආකෘතියේ භාණ්ඩාගාර මුද්‍රිත (SA52) අනුව සටහන් කළ යුතු වර්ෂය තුළ හර කිරීම් සහ බැර කිරීම් (11 හා 12 යටතේ) වටිනාකම් නිවැරදිව සටහන් කර නොතිබුණි.

1.6.2 ආදායම්

(අ) 2023 වර්ෂයේ අපහරණය කරන ලද භාණ්ඩ විකිණීමෙන් ලද රු.21,700 ක වටිනාකම 20 – 03 – 01 - 00 (දෙපාර්තමේන්තුමය විකිණීම්) යන ආදායම් සංකේතය යටතේ දැක්විය යුතු වුවත්, 20 – 06 – 02 – 02 (වෙනත්) යන ආදායම් සංකේතය යටතේ දක්වා තිබුණි.

(ආ) වර්ෂය තුළ අපහරණය කරන ලද රු.31,279 ක් වූ සන්නිවේදන උපකරණ විකිණීමෙන් ලද ආදායම් වූ රු.1,000 (20.06.02.02) ක වටිනාකම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ නිමිකම් ඉවත් කිරීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම් යටතේ දැක්විය යුතු වුවද, එය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වැය විෂයයන් 08 කට හා මූලධන වැය විෂයයන් 02 ක් සඳහා ප්‍රතිපාදිත රු.26,120,000 කින් රු.10,923,533 ක් ඉතිරි වී තිබූ අතර, එම ඉතිරිවීම් සියයට 26 සිට සියයට 99 ක පරාසයක් ගෙන තිබුණි.

(ආ) 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ 02 (ඇ) (ii) ඡේදය ප්‍රකාරව 1403 (විදුලිය හා ජලය) සඳහා වියදම් අවම කළ යුතු වුවත්, 1403 වැය විෂයය සඳහා රු. 1,000,000 ක් එනම් සියයට 48 ක් මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මඟින් ලබාගෙන වියදම් දරා තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) මූල්‍ය ප්‍රකාශනය තුළ ඇතුළත් දෙසැම්බර් 31 දිනට බැරකම් පිළිබඳ ප්‍රකාශනයට අනුව රු.407,682 ක බැරකම් පැවතිය ද භාණ්ඩාගාර මුද්‍රිත SA 92 හි එම බැරකම් වාර්තා කර නොතිබුණි.

(ආ) 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.3 ඡේදය අනුව ආයතනයේ බැඳීම් හා වගකීම් හෙළිදරව් කළ යුතු වුවත්, 2023 වර්ෂයට අදාළ රු. 9,000 ක් වූ බැරකම්, බැරකම් ලේඛනයේ සහ 2023 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

2.3 **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම් සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථානයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1.2 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i. 139 (4)	මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවනු ලබන සෑම මුදලකටම විධිමත් කුවිතාන්සියක් ලබාගත යුතු වුව ද, ගෙවීම් වවුචර් 16 ක් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි.
ii. 262 (2) සහ 262 (3)	මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවන ලද සියලුම වවුචර්වලත් ඒවා නඟවුරු කරන ලියවිලිවලත් "ගෙවන ලදි" මුද්‍රාව යොදා තම කෙටි අත්සන යෙදිය යුතු නමුත්, ඒ අනුව කටයුතු කර නොතිබුණු අවස්ථා 28 ක් විය.
iii. 1645 (ආ), (ඇ)	මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන 04 ක් සම්බන්ධයෙන් වාහන ලොග් සටහන් පොත් සහ දෛනික ධාවන සටහන් යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(ආ)2017 දෙසැම්බර් 21 දිනැති චක්‍රලේඛ කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 හි ඡේද 2 (i)	අධිකරණ අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත ලබාදී තිබුණු නිල රථ දෙකක් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	
i. 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 03 ඡේදය	වාහන දෙකක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව මාසික වාර්තාව පිළියෙල කර නොතිබුණි.
ii. 2008 පෙබරවාරි 06 දිනැති සහ 2018 ජනවාරි 24 දිනැති	චක්‍රලේඛ ප්‍රකාරව රාජ්‍ය අංශයේ ක්‍රියාකාරකම් වඩාත් කාර්යක්ෂම කිරීමට සහ ඒ සඳහා සම්බන්ධවන්නා වූ පාර්ශවයන් අතර මනා අවබෝධයක් සහ එකිනෙකා අතර විශ්වාසය වැඩි දියුණු කිරීමට

අංක 05/2008 සහ 05/2008 (i) දරන චක්‍රලේඛ	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම සිදු කළ යුතුව තිබුණ ද, කොමිෂන් සභාව විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම් සිදුකර නොතිබුණි.
(ඇ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 04 ඡේදය	i. කොමිෂන් සභාව විසින් 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් 2023 පෙබරවාරි 01 අනුමත කර තිබුණු අතර, විගණකාධිපති වෙත 2023 ඔක්තෝබර් 10 දින ඉදිරිපත් කර තිබුණි.
	ii. චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන මාර්ගෝපදේශයේ අංක 13 හි ඇතුළත් සවිස්තර ප්‍රසම්පාදන සැලැස්ම, ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.
	iii. චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ප්‍රවර්තන වර්ෂයේ පුනරාවර්තන වැඩසටහන් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.5 **තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම**

2020 අගෝස්තු 28 දිනැති අංක 01 / 2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව කිසියම් විශේෂිත කාර්යයන් සඳහා ලබාදෙන අතුරු අග්‍රිම දින10 ක් ඇතුළත නැවත පියවිය යුතු වුවත්, අවස්ථා 04 කදී ලබාදුන් රු.98,000 ක් වටිනාකමැති අතුරු අග්‍රිම පියවීමේ කාල ප්‍රමාදය දින 13 ත් දින 14 ත් අතර විය.

3 **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

3.1.1 **සැලැසුම් කිරීම**

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 03 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුවත්, 2023 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම 2023 පෙබරවාරි 01 දින අනුමත කර තිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන මාර්ගෝපදේශයේ අංක 12 (ආ) හි සඳහන් වගකීම් ක්ෂේත්‍රය, වගකිව යුතු නිලධාරියා සහ ප්‍රතිදානය (Out put) සම්බන්ධයෙන් විස්තර, පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම තුළ

අන්තර්ගත කර නොතිබුණි. තව ද, ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාලරාමුව මාසිකව ඉදිරිපත් කළ යුතු නමුත්, ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ නිශ්චිතව කාලරාමුව හඳුනාගෙන නොතිබුණි.

(ඇ) 2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රාග්ධන වියදම් සඳහා රු.500,000 ක් සැලැසුම්ගත කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය තුළ සත්‍ය ප්‍රාග්ධන රු.201,810 ක් විය. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්මට අනුව සියයට 60 ක් මිලදී ගැනීම් සිදු කර නොතිබුණු අතර, කොමිෂන් සභාව විසින් සැලැසුම් සකස් කිරීමේදී තාත්ත්වික තත්ත්වය සැලකිල්ලට ගෙන නොතිබුණි.

3.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ගත වීමට ප්‍රථම සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, 2020,2021 වර්ෂවල කාර්යසාධන වාර්තා 2023 මාර්තු 26 දින පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව 2020 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සඳහා වර්ෂ 03 මාස 10 ක කාල ප්‍රමාදයක් හා 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සඳහා වර්ෂ 02 මාස 10 ක කාල ප්‍රමාදයක් පැවතුණි. එමෙන්ම 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව වාර්තාවේ දින වන විටත් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, ඒ සඳහා වර්ෂ 01 මාස 11 ක කාල ප්‍රමාදයක් පැවතුණි

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි ඡේද අංක 11.1 ප්‍රකාරව, මුදල් රෙගුලාසි 756 (6) ඡේදය අනුව භාණ්ඩ සමීක්ෂණය සිදු කර අවසන් කළ යුතු කාලරාමුව අනුව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම අදාළ වර්ෂයේ දෙසැම්බර් 15 ට පෙර සිදු කළ යුතු වුවත්, 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය 2024 ජනවාරි 04 දින පත් කර තිබුණි.

3.3 පාඩු හා හානි

මෝටර් රථයක් හානියට පත් වීම සම්බන්ධයෙන්, මුදල් රෙගුලාසි අංක 103 (1) (ඉ) ප්‍රකාරව හානිවීම් ලේඛනයෙහි සටහන් කළ යුතු නමුත් මෙම හානිය, හානිපාඩු ලේඛනය තුළ ඇතුළත් කර නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

(අ) මුදල් රෙගුලාසි 506 (ඩී) ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ මුදල් රෙගුලාසි 503 (1) යටතේ ගැලපුම් ඉවත් කළ පසු තථ්‍ය අගයයන් දක්වා නොතිබුණි.

(ආ) වසර 06 ට වැඩි කාලයක සිට පැවත එන සේවය හැර ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.185,000 ක් වූ ණය ශේෂය අය කරගැනීම් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv වෙනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) අත්තිකාරම් 'බී' ගිණුමේ අමුණුම් 3.1 සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂයන් යටතේ එක් නිලධාරිනියකගේ උත්සව අත්තිකාරම් ශේෂය රු.10,000 ක් වූ නමුත් CC10 ලේඛනය අනුව 2023 දෙසැම්බර් 31 දිනට රු.10,000 ක ශේෂයක් දක්වා නොතිබුණි.

4 තිරසාර සංවර්ධනය

2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩිඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනාගෙන තිබුණ ද, එම තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි.

5 යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඡේද අංක 40 (1) ප්‍රකාරව කොමිෂන් සභාව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා එම කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් පත් කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයකු සිටිය යුතු නමුත්, කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුරක් ඇතුළත් කර නොතිබුණි. තව ද 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙහි 03 ඡේදය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ/ ගණන්දීමේ නිලධාරියාගේ සෘජු අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I පන්තිය නිලධාරියෙකුගේ ප්‍රධානත්වය දරන අභ්‍යන්තර විගණන අංශයක් සියලුම විශේෂ වියදම් ඒකක සඳහා ස්ථාපිත කළ යුතු නමුත්, කොමිෂන් සභාව තුළ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සේවා කාණ්ඩය	අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	(පුරප්පාඩුව)/ අතිරික්තය
ජ්‍යෙෂ්ඨ මට්ටම	15	06	(9)
තෘතීයික මට්ටම	04	02	(2)
ද්විතීක මට්ටම	73	44	(29)
ප්‍රාථමික මට්ටම	25	11	(14)
එකතුව	117	63	(54)

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 117 ක් වුවද, දෙසැම්බර් 31 දින වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 ක්, තෘතීයික මට්ටමේ තනතුරු 02 ක් ද, ද්විතීක මට්ටමේ තනතුරු 29 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 14 ක ඌනතාවයක් පැවතුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය තුළ නොමැති අධිකරණ රෙජිස්ට්‍රාර් තනතුරු 03 ක් SL 1 වැටුප් තලයෙහි ද, එක් තනතුරක් MN - 6 වැටුප් තලයෙහි ද පිහිටුවා තිබුණි. තව ද, අනුමත කාර්ය මණ්ඩලය තුළ ලඝුලේඛන (Court Stenographer) තනතුරු 01 ක් MN 2 වැටුප් තලයෙහි අනුමත කර තිබුණ ද, ඊට අමතරව සත්‍ය කාර්ය මණ්ඩලය තුළ ලඝුලේඛන (Court Stenographer) තනතුරු 01 ක් MN 7 හි වැටුප් තලයෙහි පිහිටුවා තිබුණි.

(ඇ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම 2018 වර්ෂයේ සිට සිදුකළ යුතු වුවත්, මේ දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර, චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් කොමිෂන් සභාව විසින් පිළියෙල කර නොතිබුණි.

ආර්.එස්. කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

හතරවන කොටස

කාර්යසාධන දර්ශක

4.1 2023 වර්ෂයේ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම

අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තථ්‍ය නිමැවුම			
		100% - 90%	89% - 75%	74% - 50%	49% - 0%
A -1	මුල් අවස්ථා අධිකරණ විනිසුරුවරුන්, දිසා විනිසුරුවරුන්, මහේස්ත්‍රාත්වරුන් සහ කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් බඳවා ගැනීම හා පත්කිරීම	100%			
A -2	අධිකරණ නිලධාරීන්ගේ හා කම්කරු විනිශ්චය සභාපතිවරුන්ගේ උසස්වීම්, වාර්ෂික වැටුප් වර්ධක, ස්ථාන මාරු කටයුතු සහ විවිධ ඉල්ලීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම	100%			
A -3	අධිකරණ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු හා නිවාඩු ගොනු පවත්වා ගැනීම	100%			
A -4	කම්කරු වන්දි කොමසාරිස් සහ නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් බඳවා ගැනීම, පත් කිරීම සහ ගොවිජන සමාලෝචන මණ්ඩල සඳහා හා පරිපාලන අභියාචන විනිශ්චයාධිකාර වැඩිහිටි නඩත්තු මණ්ඩලය සඳහා සාමාජිකයින් බඳවා ගැනීම හා පත්කිරීම	100%			
A -5	අධිකරණ නිලධාරීන් හා අධිකරණ පද්ධතිය සම්බන්ධ විවිධ චක්‍රලේඛ සැකසීම හා නිකුත් කිරීම	100%			
A -6	අධිකරණයන්හි පවතින නඩු පිළිබඳ සංඛ්‍යා ලේඛන ඊමේල් පණිවිඩ මගින් මාසිකව ලබාගෙන එම සංඛ්‍යා ලේඛන පරිගණකගත කිරීම, වාර්තා සකස් කිරීම හා විනිශ්චයකාරවරුන්ගේ වැටුප් වර්ධක සහ උසස්වීම් ලබා දීමේදී ඒ පිළිබඳ සලකා බැලීම.	100%			
A -7	උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ හා සංවර්ධන නිලධාරීන්ගේ, ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු හා සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු සිදු කිරීම	100%			
A -8	උපලේඛනගත නිලධාරීන් සම්බන්ධව ලැබෙන පැමිණිලි පිළිබඳ කටයුතු කිරීම.				25%
A -9	අදාල අධිකරණවල ඉල්ලීම මත නඩු කටයුතු සඳහා සංඥා භාෂණ පරිවර්තකයින් සහ විදේශ භාෂා පරිවර්තක සේවය සඳහා භාෂා පරිවර්තකයින් යොමු කිරීම	100%			
A -10	අධිකරණවල ඉල්ලීම මත සුදුසු පරිදි අධිකරණ භාෂණ පරිවර්තක සහ අධිකරණ ලඝු ලේඛක නිලධාරීන් අනුයුක්ත කිරීම	100%			

A -11	විනිසුරුවරුන්ගේ ඉල්ලීම් මත සහ සේවා අවශ්‍යතා මත උපලේඛනගත නිලධාරීන්ගේ හා සංවර්ධන නිලධාරීන්ගේ තාවකාලික අනුයුක්තයන් සිදු කිරීම	90%			
A -12	කාර්යක්ෂමතා කඩඉම් විභාග 12ක් පැවැත්වීම			70%	
A -13	නව සේවා ව්‍යවස්ථාව අනුව බඳවා ගැනීමේ විවෘත/සීමිත තරඟ විභාග පැවැත්වීම				* 0%
A -14	දිවයිනේ පිහිටුවනු ලබන නව අධිකරණ සඳහා මු.රෙ. 71 අනුව අධිකරණ කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීම	100%			
A -15	මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සිට අධිකරණ පොත් බැඳුම්කරුවන් දක්වා විනය හා විමර්ශන කටයුතු			70%	
A -16	ලංකාව පුරා ඇති ක්වාසි අධිකරණ 65 හි පරිපාලන කටයුතු සිදුකිරීම (ක්වාසි විනිසුරුවරුන් බඳවාගැනීම හා ඔවුන්ට එරෙහිව එන පැමිණිලි සම්බන්ධව ක්‍රියාකිරීම)		75%		
A -17	දිවයිනේ සියලුම අධිකරණවල සහ මෙම කාර්යාලයේ සේවයේ නියුතු උපලේඛනගත සහ උපලේඛනගත නොවන රජයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් කටයුතු කිරීම	100%			
B -1	අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත අධිකරණ සේවය සම්බන්ධව එවනු ලබන පෙත්සම් පිළිබඳව ක්‍රියාත්මක වීම			60%	
B -2	තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ වූ කාර්යයන්				47%
C -1	සාමාන්‍ය පරිපාලන සහ ගිණුම් කටයුතු පවත්වාගෙන යාම	100%			

* 2022.04.26 දිනැතිව මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 මගින් බඳවා ගැනීම් කල් තැබීම නිසා

4.2 2022 වර්ෂයේ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ආයතනයේ කාර්ය සාධන දර්ශක

ඉහත **4.1** මගින් පෙන්වා ඇති ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට අයත් **A, B** හා **C** යන දර්ශක වලින් වෙන් වෙන්ව නිරූපිත දර්ශක වල තථ්‍ය නිමවුම් වල සාමාන්‍ය, ප්‍රධාන කාර්යසාධන දර්ශක **03**ක් වශයෙන් සාරාංශ ගත කොට පහත දක්වා ඇත.

අංකය	දර්ශකය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තථ්‍ය නිමැවුම			
		100% - 90%	89% - 75%	74% - 50%	49% - 0%
A	අධිකරණ සේවා කොමිෂන් සභාවේ විෂය පථයට යටත් සහ ව්‍යවස්ථාදායකය මගින් බලය පවරා ඇති තනතුරු සඳහා බඳවා ගැනීම, පත්කිරීම, අනුයුක්ත කිරීම, ස්ථාන මාරු කිරීම, විනය හා විමර්ෂණ කටයුතු, වැටුප් වර්ධක, සේවයේ උසස් කිරීම් හා පුහුණු කිරීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.	-	84%	-	-
B	පොදු මහජනතාව අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන පැමිණිලි, තොරතුරු දැන ගැනීමේ පනත යටතේ සිදු කරන ඉල්ලීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.	-	-	53.5%	-
C	අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාන්‍ය පරිපාලනය සහ ගිණුම් කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.	100%	-	-	-

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
තිරසාර සංවර්ධනය උදෙසා සෑමට සාමකාමී හා සාධාරණ සමාජයක් ඇති කිරීම, සියලු දෙනාට සාධාරණත්වයත්, නීතියේ රැකවරණයත් ස්ථාපිත කිරීම, සියලු මට්ටම් වලින් වගවීම හා කාර්යක්ෂමතාවයෙන් යුත් යුක්තිය පසිඳලන ආයතන ස්ථාපිත කිරීම	ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම සහ සෑමට යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් ඇති කිරීම හා සෑම මට්ටමකින්ම ඵලදායී, විනිවිද, වගවීමක් සහිත යුක්තිය පසිඳලන ආයතන ස්ථාපිත කිරීම	තොරතුරු දැන ගැනීමේ පනත මගින් ඉදිරිපත් කල ඉල්ලීම් ගණන හා ඒ සඳහා ප්‍රතිචාර ලබා දීමේ ප්‍රතිශතය	47%	-	-
		අධිකරණ නිලධාරීන් හා කාර්යමණ්ඩලය සම්බන්ධව ලද පෙත්සම් ගණන හා ඒ සඳහා ප්‍රතිචාර ලබා දීමේ ප්‍රතිශතය	-	60%	-
		නඩු කටයුතු සම්බන්ධව ලද පෙත්සම් ගණන හා ඒ සඳහා ප්‍රතිචාර ලබා දීමේ ප්‍රතිශතය	-	-	80%

* අධිකරණ නිලධාරීන්, කාර්ය මණ්ඩලය හා නඩු කටයුතු සම්බන්ධව ලැබෙන පැමිණිලි/ඉල්ලීම් පිලිබඳව ක්‍රියාමාර්ග ගැනීමේදී, එම ගනු ලබන ක්‍රියාමාර්ග හා සබැඳිව ප්‍රතිචාර දැක්විය හැකි අවස්ථාවන්වලදී පමණක් එම පැමිණිලි/ඉල්ලීම් ඉදිරිපත් කල පාර්ශවයන්ට ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමට ක්‍රියා කරනු ලබයි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පිළිබඳ සාරාංශය

6.1 අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල විස්තරය

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු/(අතිරික්ත) සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	15	09	06
තෘතියික	04	04	-
ද්විතියික	73	44	29
ප්‍රාථමික	25	09	16
කොන්ත්‍රාත් පදනම මත	-	-	-
මුළු සංඛ්‍යාව	**117**	**66**	**51**

6.2අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ හිඟ කාර්ය මණ්ඩල කළමනාකරණය පිළිබඳ විස්තරය

2023.12.31 දිනට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ තථ්‍ය සේවක සංඛ්‍යාව 66කි. මෙම ලේකම් කාර්යාලයේ විවිධ තනතුරුවල තත්‍ය පුරප්පාඩු සංඛ්‍යාව 79 ක් වන අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් 68% ක ප්‍රතිශතයක් ගනී. විවිධ තනතුරු සඳහා පවතින එම පුරප්පාඩු 79 න් 28 ක් අධිකරණ නිලධරයන්ගේ හා උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවට අයත් නිලධාරීන්ගෙන් පූරණය කර ගනිමින් රාජකාරී ඉටු කර ගැනීමට කටයුතු කර ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ කටයුතු තාවකාලික පරිශ්‍රයක පවත්වාගෙන යන බැවින් මෙම නිලධාරීන් පූරණය කරගැනීම මත වැඩිවන අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා ඉඩ පහසුකම් නොමැති බැවින් එම බඳවා ගැනීම් සිදුකර නොමැත.

6.3 මානව සම්පත් සංවර්ධනය

අධිකරණ වල සේවයේ නියුතු උපලේඛනගත නිලධාරීන් සඳහා පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් වල සාරාංශය 2023

අනු අංකය	පුහුණු වැඩසටහන	මාධ්‍යය	දින ගණන	පැවැත්වූ වැඩසටහන් ගණන	සහභාගී වූ නිලධාරීන් ගණන
1	සිවිල් නීතිය, අපරාධ නීතිය, සාමාන්‍ය පරිපාලනය සහ කාර්යාල කළමනාකරණය හා විනය කාර්යය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන	සිංහල	3	5	150
2	කලාප පුහුණු වැඩසටහන්				
	රත්නපුර සහ ඇඹිලිපිටිය මහාධිකරණ කලාපයන්	සිංහල	2	7	308
	නුවරඑළිය සහ බදුල්ල මහාධිකරණ කලාපයන්	සිංහල	2		303
	මහනුවර සහ කෑගල්ල මහාධිකරණ කලාපයන්	සිංහල	2		464
	කුරුණෑගල මහාධිකරණ කලාපය	සිංහල	2		201
				12	1426

අනුකූලතා වාර්තාව

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දින ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.6	වෙනත්	-		
2	**පොත් සහ ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල නොවේ	ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත	අධිකරණ සේවා කොමිෂන් සභා පැරණි ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ **(CIGAS)** පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය **(GA-N20)** යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රේ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		

3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත	අධිකරණ සේවා කොමිෂන් සභා පැරණි ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට **(NDB)** නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණන**			
6.1	මු.රෙ. **134(2) DMA/1-2019** අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත	අධිකරණ සේවා කොමිෂන් සභා පැරණි ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත	අධිකරණ සේවා කොමිෂන් සභා පැරණි ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත	අධිකරණ සේවා කොමිෂන් සභා පැරණි ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ	ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත	අධිකරණ සේවා කොමිෂන් සභා පැරණි ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
7	**විගණන හා කළමනාකරණ කමිටු**	-		

7.1	**DMA** චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම	අනුකූල නොවේ	ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත	අධිකරණ සේවා කොමිෂන් සභා පැරණි ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛනයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මූදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ වාර්තා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	පළමු වෙන්දේසියෙන් වෙනදේසි නොවූ අයිතම සඳහා දෙවන වෙන්දේසියක් පැවැත්වීමට සිදු වීම හේතුවෙන්	ඉදිරියට නියමිත පරිදි සිදු කිරීම
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			

9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මූදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 91(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අදාල නිලධාරියා සේවය හැර ගොස් තිබීම	ආයතන සංග්‍රහය සහ අදාල චක්‍රලේඛ අනුව අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අදාල නොවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අදාල නොවේ		

14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මූ.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මූ.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
	මූ.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	හිඟ ආදායම් නොමැත		
16	**මානව සම්පත් කළමනාකරණය**			

16.1	අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්යය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති **MSD** චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවත් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	-	චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින්	අනුකූල නොවේ	-	චක්‍රලේඛය අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය

	ක්‍රමවේදයක් සකස් කොට තිබීම			සඳහා ක්‍රමවේදයක් සකස් කරමින් පවතී.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	කාර්ය සාධනය ඇගයීම සඳහා අධිකරණවල කාර්යක්ෂමතාවය සහ සඵලදායීතාවය ඉහළ නැංවීමට තුඩුදෙන වඩාත් ප්‍රායෝගික කාර්ය සාධන ඇගයීම් ක්‍රමවේදයක් යෝජනා කිරීම යන අරමුණු ඔස්සේ සමාලෝචනය කර වාර්තා කිරීමට මේ වන විට කමිටුවක් පත් කර ඇති අතර එහි කටයුතු අවසන් වූ පසු අදාල නිර්දේශ අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඒ අනුව සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත.
19.2	කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	-	මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවතී
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතය පදනම් කර ගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	-	මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවතී

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		